# සාරාංශය

"නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ චර්යා සංවර්ධනය සඳහා ගුරුවරුන්ගේ දායකත්වය" පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

අධ්‍යයනය සඳහා අරමුණු පහක් පදනම් කර ගන්නා ලදි. නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ චර්යා පිළිබඳ ගුරුවරුන් සතු දැනුවත්භාවය විමසා බැලීම, නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ චර්යා සංවර්ධනය සඳහා ගුරුවරු අනුගමනය කරන ක්‍රියා මාර්ග විමසා බැලීම, එම ක්‍රියා මාර්ග සිදු කිරීමේ දී ගුරුවරු මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම, නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ චර්යා සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට ගුරුවරුන්ට ගත හැකි ක්‍රියා මාර්ග හඳුනා ගැනීම හා නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ චර්යා සංවර්ධනය සඳහා ගුරුවරුන්ගේ දායකත්වය වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම එම අරමුණු ලෙස සඳහන් කළ හැකිය.

මහනුවර අධ්‍යාපන කලාපයේ, පාතහේවාහැට අධ්‍යාපන කොට්ඨාශයේ 1AB, 1C හා 2 වර්ගයේ පාසල් 6 ක ගුරුවරුන් 68, සිසුන් 36 ක් හා එම පාසල්වල විදුහල්පතිවරුන් 6 දෙනෙක් මෙම අධ්‍යයනයේ දී නියැදිය ලෙස යොදා ගන්නා ලදි. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා නියමාවලි දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස භාවිත කරන ලදි. මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම ඇසුරෙන් සිදු කරන ලදි.

නව යොවුන් වියේ සිසුන්ට ආවේනික පොදු චර්යා පිළිබඳව ගුරුවරුන් තුළ අවබෝධයක් ඇති බවද, එම සිසුන්ගේ යහපත් හා අයහපත් චර්යා පිළිබඳව ගුරුවරුන් තුළ අවබෝධයක් ඇති බව ද අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය. සිසුන්ගේ චර්යා සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රමුඛ ක්‍රියා මාර්ගය වී ඇති බව ද, චර්යා සංවර්ධනය සඳහා ගුරුවරුන් සාම්ප්‍රදායික ක්‍රියා මාර්ග කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන අතර බාහිර පෙළඹවීම් ක්‍රියා මාර්ග අනුගමනය කරන බවද හඳුනා ගැනීමට හැකි විය.

සිසුන්ගේ චර්යා සංවර්ධනයට ක්‍රියා මාර්ග සිදු කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු වැඩි ප්‍රමාණයක් පාසලට සමීප පාර්ශව වටා කේන්ද්‍රගත වී ඇති බව ද, අයහපත් චර්යා අවම කිරීමට ක්‍රියා මාර්ග සිදු කිරීමේ දී ගැටලු ඇතිවීමේ වැඩි ප්‍රවණතාවක් ඇති බව ද හඳුනා ගැනීමට හැකි විය.

මෙම අධ්‍යයනය මගින් සිසු චර්යා සංවර්ධනයට අවශ්‍ය දැනුම හා කුසලතා සංවර්ධනය කර ගැනීමට, සිසුන් හා ඔවුන්ගේ දෙමාපියන් සමඟ යහපත් සම්බන්ධතාවක් පවත්වා ගැනීමට, නව යොවුන් වියේ සිසුන් පිළිබඳ ධනාත්මක ආකල්ප සංවර්ධනය කර ගැනීමට ගුරුවරුන්ට යෝජනා කර ඇත. මෙම අධ්‍යයනය මගින් පාසල් පාදක ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද, ගුරු, සිසු, දෙමාපිය සම්බන්ධතා ශක්තිමත් කෙරෙන වැඩසටහන් සිදු කිරීමට ද විදුහල්පතිවරුන්ට යෝජනා කර ඇත.

UNIVERSITY OF SRI LA... LIBRARY